



# ව්‍යවසායකත්ව ප්‍රතිලාභ

U.B.I.S.අබේවර්ධන
කෑ/දෙහි/මානියම්ගම මහා විද්‍යාලය


INNOVATION
KNOWLEDGE
BUSINESS
Entrepreneur
TEAM
LEADERSHIP
RISK TOLERANCE
ASSERTIVENESS


WWW
iDEA 45% is SALE!
TEAM
internet
MARKETING
SUCCESS
CLOUD







# ව්‍යවසායකත්ව ප්‍රතිලාභ

- ව්‍යවසායකයාට
- දේශීය ආර්ථිකයට

# ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ

- ස්වකීය දෛවය තමා මත ම රදවා ගැනීම
- කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම
- ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකිවීම
- ආකර්ශනීය ලාභයක් ඉපයීම
- ස්වයංපෝෂිත බව
- සමාජීය සුබසාධනයට දායකවිය හැකි වීම
- නිදහස හා ඉහළ තෘප්තියකට පත්වීම
- පුද්ගල වර්ධනය සදහා ඉඩ ප්‍රස්තා හිමිවීම

# 1.ස්වකීය දෛවය තමා මත ම රඳවා ගැනීම






එනම් , ව්‍යවසායකයා සැමවිටම තමන් විසින්ම සැලසුම් සකස් කරගනිමින් තම ව්‍යාපාරය දියුණුකර ගැනීමට වෙහෙස මහන්සි වී කටයුතු කිරීම වේ. අන් අයගේ මතයන්ට ගරු කරමින් තම ව්‍යාපාරික කටයුතු සම්බන්දව තීණ්දු තීරණ ගැනීම තමාන් විසින්ම සිදුකල යුතු බව පිලිගනී.මොහුගේ කැපකිරීමේ ප්‍රමාණය මත සාර්තක අසා්ථක බව රදා පවතී.
( ඉහත රූප සටහන බලන්න. → රශ්මා නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයකු තම ව්‍යාපාරය සඳහා නිවාස සෑදීමේදි අවශ්‍ය වන විවිධ උපකරණ එකම වහලක් යටින් පාරිභෝගිකයාට ලබාගත හැකි අයුරින් තම ව්‍යාපාරය පුලුල් කර සාර්ථකත්වයට පත්වීමට කටයුතු කර ඇත.)

<u>එසේ සාර්ථකත්වයට පත්වන පුද්ගලයා හට</u>

සමාජීය පිළිගැනීම

නායකත්වය හිමිවීම

කීර්ති ප්‍රශංසා හිමිවීම ආදිය නිරායාසයෙන්ම හිමිවේ.

# 2.කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම



ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ නිරතවන පුද්ගලයා විවිධ අවස්ථාවන් වලදී විවිධ භූමිකාවල නිරත වන බව අප ඉගෙනගෙන ඇත.

ඒවා නම්

- අයිතිකරුගේ භූමිකාව
- කලමනාකරුගේ භූමිකාව
- නායකයකුගේ භූමිකාව    ලෙස දැක්විය හැක.

එබැවින් එම එක් එක් අවස්ථා වලදී ඔහු විසින් ඉහත භූමිකාවන් ලෙස පහත කාර්යයන් ඉටු කරයි.

1. අයිතිකරු - ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් සම්පාදනය
2. කලමනාකරු - ව්‍යාපාර සැලසුම් සකස් කිරීම හා සංවිධානය
3. නායකයකු - ව්‍යාපාර කටයුතු පිළිබඳ තීරණ ගැනීම, සේවකයන් මෙහෙයවීම

# 3.ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකිවීම

පුද්ගලයා තුල සාමාන්‍යයන් දක්නට ලැබෙන දක්ෂතාවයන්ගෙන් ඔබ්බට ගොස් ඔහු තුළ ඇති සැගවුනු දක්ෂතාවයන් මොනවාද යන්න පුද්ගලයා තුලින්ම අවබෝධ කරගෙන එම සහජ හැකියාවන් තම ව්‍යාපාරික කටයුතු වලට යෙදවීමෙන් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැක.



# 4.ආකර්ශනීය ලාභයක් ඉපයීම




ව්‍යාපාරයේ පැවැත්ම සදහා අනිවාර්යයෙන් ප්‍රමාණවත් ලාභයක් ඉපයිය යුතුවේ.

- ✓ තම ව්‍යාපාරික කටයුතු සාර්ථකව ඉදිරියට පවත්වාගෙන යාමටත්
- ✓ තම සේවකයන්ගේ ජීවන තත්වය උසස්කරලීමටත්
- ✓ තම ජීවිතය සාර්ථක කරගැනීමටත්

වඩාත් හොද ලාභයක් ඉපයිය යුතුය

# 5.ස්වයංපෝෂිත බව



පුද්ගලයකුට තම දෛනික අවශ්‍යතා හා වුවමනා සපුරාගෙන සාර්ථක දිවියක් ගත කිරීමට මෙන්ම සමාජයේ විවිධ අවස්ථාවන්ට තම දායකත්වය ලබාදීම සදහා ප්‍රමාණවත් තරම් ආදායම් මට්ටමක් පැවතීමය යුතුය. එබැවින් තම ව්‍යාපාරික කටයුතු වලින් තම සාර්ථකත්වය සපුරාගැනීම තුලින් ඔහු අන් අය මත නොරැදී ස්වයංපෝශිත වේ.

# 6.සමාජීය සුබසාධනයට දායකවිය හැකි වීම

- රැකියා අවස්ථා නිර්මාණය කිරිම
- රජයේ සුභසාධන කටයුතු වලට උදව් කිරීම
- නිවාස අහිමි වූ අයට නිවාස ලබාදීම
- පාසල් දරුවන්හට අධ්‍යාපනය සඳහා උදව් කිරීම
- උපකරණ, මුදල් ආධාර ලබාදීම
- පොදු වැඩ සඳහා උදව් දීම
- හදිසි විපත් වලදී සහය වීම
- දරුවන්ට ශිෂ්‍යත්ව වැඩසටහන් ලබාදීම








# 7.නිදහස හා ඉහළ තෘප්තියකට පත්වීම



සැමවිටම ව්‍යවසායකයා නිදහස් මත් දරණ හා ස්වයංපෝෂිත පුද්ගලයෙකි. එබැවින් ඔහුට රිසි සේ තම කාර්යයන් සිදු කිරීම මෙන්ම තම පෞද්ගලික නිදහස උපරිම ලෙස භුක්ති විදිය හැක.

# 8.පුද්ගල වර්ධනය සඳහා ඉඩ ප්‍රස්තා හිමිවීම



සැමවිටම ව්‍යවසායකයා සැලසුම් සහගතන ක්‍රියාකරන බැවින් ඉතා කෙටි කාලයක් තුල ඔහුට තම සැලසුම් කල අරමුණු කරා ලගා වීමේ මාර්ගය කරා පිවිසිය හැකිය.එයින් ධෛර්යමත් වන මොහු සිය කැපකිරීම්, අභියෝග , කඩා වැටීම් ආදිය හමුවේ ඒවා තම ජීවිතයට ආශිර්වාදයක් කරගනිමින් තම ගමන අති සාර්ථකව නිම කිරීමට පෙලබෙයි.

# දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ

- දේශීය සම්පත් උපයෝජනය කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනයක් සිදුවීම
- නව භාණ්ඩ හා සේවා වෙළඳපලට ඉදිරිපත් කිරීම
- රැකියා අවස්ථා ජනනය කිරීම
- විදේශ විනිමය ඉපයීමට හැකිවීම
- රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම
- ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම
- ආර්ථික සංවර්ධනයට දායක වීම

# 1.දේශීය සම්පත් උපයෝජනය කිරීම



ව්‍යවසායකයා නිරන්තරයෙන්ම කටයුතු කරනුයේ පරිසරයේ ඇති ව්‍යාපාරික අවස්ථාවන් හඳුනාගනිමිනි. එබැවින් ඔහු පරිසරයේ ඇති භාවිතයට නොගත් සම්පත් භාවිතා කරමින් නව ව්‍යාපාරික අවස්ථාවන් බිහිකරනු ලබයි.

# 2.ප්‍රාදේශීය සංවර්ධනයක් සිදුවීම




ව්‍යවසායකයා විසින්
නව නිර්මාණ බිහිකිරීම
තුලින් රැකියා අවස්ථා
ජනනය වීම මෙන්ම
එම ව්‍යාපාර පරිසරය
පිහිටි ස්ථාන හා අවට
පරිසරයද දියුණුවක්
දැකිය හැකිය.

උදා -

මංමාවත්

යටිතල පහසුකම්

නව ව්‍යාපාරික අවස්ථා

# 3.නව භාණ්ඩ හා සේවා වෙළඳපලට ඉදිරිපත් කිරීම




**මොහු සැමවිටම වෙළඳපල තුල පවතින භාණ්ඩය හෝ සේවාවට අමතරව වෙනස් ස්වරූපයකින් වෙළඳපල තුලට යොමුකරන බැවින් පාරිභෝගිකයින් හට වෙන්ස් වූ විවිධාකාර වූ නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට ඉඩ සැලසේ.**

# 4.රැකියා අවස්ථා ජනනය කිරීම







ව්‍යවසායකයා තම අදහස් හා අවස්ථා තුලින් නව්‍යතා සම්පාදකයේ යෙදෙන බැවින් එම නව්‍යතා වෙළදපල තුලට ලබාදීම සදහා මහා පරිමාණව නිෂ්පාදන කටයුතු සිදුකලයුතු බැවින් ඒ සදහා පුද්ගලයින් සේවයට බදවා ගනියි.එබැවින් ඒ හරහා නව රැකියා අවස්ථා බිහිවීම සේම පුද්ගල සංවර්ධනයක්ද සිදුකරලිය හැකිය

# 5.විදේශ විනිමය ඉපයීමට හැකිවීම

නව භාණ්ඩ හා සේවාවන් වලට දේශිය මෙන්ම විදේශිය වෙළදපල අවස්ථාවන් හිමිවීම මත විදේශිය මුදල් නැතහොත් විදේශ විනිමය ඉපයීමේ අවස්ථාවන් වලට මග පැදේ.








# 6.රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම



නව භාණ්ඩ හා සේවා ජනනය වීම මත වෙළදපල තුල හිගයකින් තොරව සැමදෙනාටම ඒවා ලබා ගත හැකි නිසා රටේ සමස්ථ නිෂ්පාදනය ඉහලයාමක් දක්නට ලැබේ.

# 7.ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම



රටේ බොහෝ පිරිසක් වළුසායකත්වය කෙරෙහි නැඹුරුවීම මත සුළු පිරිසක් අතර බෙදීගිය ආදායම විශාල පිරිසක් අතර බෙදීගොස් පුද්ගල ජීවන තත්වය උසස් මට්ටමකට ගෙන ආ හැකිය.






# 8.ආර්ථික සංවර්ධනයට දායක වීම










ව්‍යවසායකයන් විසින් රජය වෙත ගෙවනු ලබන බදු මුදල් මගින් රටේ සංවර්ධන කටයුතු කඩිනමින් සිදුකරලීමට හැකිවන බැවින් ඒ හරහා රටේ පොදු සේවාවන් සැපයීම මෙන්ම විවිධ අංශ කරා අරමුදල් වෙන් කිරීම මත රටේ සංවර්ධනය කඩිනම් කලහැක.

# අභ්‍යාස

1. ව්‍යවසායකත්වය තුලින් හිමිවන ප්‍රතිලාභ වර්ග නම් කරන්න
2. එම එක් එක් ප්‍රතිලාභ සඳහා උදාහරණ 5 බැගින් දක්වන්න
3. දේශිය සම්පත් උපයෝජනය කිරීම යනු කුමක්ද?
4. ව්‍යවසායකත්ව භූමිකා නම් කර එම එක් එක් අවස්ථාවන්ට උදාහරණ දක්වන්න
5. රැකියා නියුක්තිකයකු වනවාට වඩා ව්‍යවසායකයකු වීමේ වාසි මොනවාද?
6. ව්‍යවසායකත්වය තුලින් ඇතිවන සමාජ ප්‍රතිලාභ මොනවාද?


Thank you